www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇමරිකානු මිලිටරිය ඉරාක ප්‍රතිරෝධය හමුවේ සීමාන්තික උපක්‍රම යොදාගනියි

## US military adopts "no-holds barred" tactics against Iraqi resistance

**ජේම්ස් කොනාකි**
**2003 දෙසැම්බර් 01**

එක්සත් ජනපදය හා මිත්‍ර හමුදා, ඔක්තෝබරයේ දී ලද දරුනු හානිවලින් පසුව "ප්‍රධාන සටන" ඇති වූ මාර්තු හා අප්‍රේල් මාසයන් ද ඇතුලත් ආක්‍රමනයේ වෙනත් කිසිදු මාසයකට වඩා වැඩි ජීවිත හානිවලට නොවැම්බරයේ දී මුහුනපෑවේ ය. ගරිල්ලා ප්‍රහාරවලින් ද මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ප්‍රහාරවලින් ද, ඇමරිකානු හා මිත්‍ර හමුදා භටයන් 94ක් ද, ජපාන විදේශ සේවා නිලධාරීන් දෙදෙනෙක් ද ආක්‍රමනික හමුදා සේවයේ නියුතු විදේශ කොන්ත්‍රාත්කරුවන් අඩු තරමින් පස් දෙනෙක් ද මිය ගියහ. තුන්සීයකට අධික ඇමරිකන් හා මිත්‍ර හමුදා භටයන් තුවාල ලදහ.

වෙනත් ප්‍රහාරවල දී ඇමරිකාව පුහුනු කල ඉරාක පොලිස් භටයන් දුසිම් ගනනක් මිය ගියහ. නැතහොත් තුවාල ලදහ. රටේ විවිධ ඉලක්ක වෙත පහර දීමේ දී විරෝධතා සටන්කරුවන් වැඩෙන නිපුනත්වයක් ප්‍රදර්ශනය කරති. ඒ අතර හමුදා හෙලිකොප්ටර්, බැග්ඩෑඩ් ගුවන් තොටුපලේ ගුවන් යානා, නාගරික හෝටල්, පොලිස් මධ්‍යස්ථාන, තෙල් නල මාර්ග හා විජිත පාලකයන්ට සේවය කරන ඉරාකීයන් ද වෙයි. සති අන්තයේ දී, ස්පාඤ්ඤ බුද්ධි අංශයේ නම් සලකුනු නො කල වාහන දෙකකට සැඟවී සිට එල්ල කල ප්‍රහාරයෙන් සත්දෙනෙකු මිය ගිය අතර එයින් විරෝධතාකරුවන්ගේ දිරිමත් භාවයේ වැඩීයාමක් සලකුනු කරයි.

ආක්‍රමනිකයාට එරෙහිව වැඩී එන අරගලයට බුෂ් පරිපාලනයේ ප්‍රතිචාරය වී ඇත්තේ ඉරාක ප්‍රතිරෝධය බිඳ මුලිනුපුටා දැමීම සඳහා තමන් සතු සියලු ක්‍රමෝපායන් යොදාගැනීමට ඇමරිකානු හමුදාවන් මෙහෙයවීම ය.

ඉරාකයේ අල් අන්බාර් ප්‍රදේශයේ ෆලුජා වැනි නගර මුර කරන, 82 වන ගුවන් සේනාංකයේ අනදෙන නිලධාරි, මේජර් ජෙනරාල් චාර්ල්ස් ස්වානැක්, මාධ්‍යකරුවන්ට නොවැම්බර් 18 දා ප්‍රකාශ කලේ, පසුගිය මාසය වන තුරුත් අනදෙන්නන් සාමාන්‍ය ජනතාව ජීවත් වන ප්‍රදේශවල සැකකටයුතු විරෝධතාවන්ට එරෙහිව යුද ටැංකි නාශක ප්‍රහාරක යානා, ප්‍රහාරක හෙලිකොප්ටර්, හා ඉලක්ක සොයා යන බෝම්බ යොදාගැනීමට "තරමක් මැලි වූ" බව යි. "දැන් අප යොදා ගන්නා දේ පිලිබඳ කිසිදු සීමාවක් නැත. සතුරා වෙතට ම සටන පෙරට ගෙනයමින් සිදුවන අනවශ්‍ය හානි අවම කර ගැනීමට අවශ්‍ය යුද ශක්තිය ද, නිපුනතා ද අපි යොදාගන්නෙමු" යයි ඔහු තවදුරටත් කියා සිටියේ ය.

බැග්ඩෑඩයේ බොහෝ ප්‍රදේශවල පිරික්සුම් මෙහෙයුම භාර එක්සත් ජනපදයේ පලමු වන සන්නද්ධ බලකායේ අනදෙන බ්‍රිගේඩියර් ජෙනරාල් මාටින් ඩෙම්ප්සේ, මාධ්‍ය හමුවක දී නොවැම්බර් 20 දා ප්‍රකාශ කලේ "ඔබගේ රට අභිමානයට පත්කරමින් සටන අවසන් කිරීමට ඔබට අවශ්‍ය ඕනෑම දෙයක් කරන ලෙස මා හට ඉඳුරාම කියා සිටි එක්සත් ජනපද ජනාධිපති දක්වාම දිවයන අනදෙන මන්ඩල දාමයෙන් මා වෙත ලැබුනු ආශිර්වාදය තිබෙන" බව යි. "මෙහි භාවාර්ථය කවරක් වුව ද ඉන් දැක්වෙන්නේ මට සුදුසු යයි හැඟෙන ආකාරයට ඉරාක බැග්ඩෑඩයෙහි සටන ගෙනයාමට මා වෙතට ලැබී තිබෙන නිදහස යි."

ස්වානැක් හා ඩෙම්ප්සේ වැනි හමුදා අනදෙන්නන් පසුගිය සති කිහිපය පුරා ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය ක්‍රමය ලෙස සලකනු ලැබුවේ ඉරාක ජනතාවට එරෙහි තිරශ්චීන ත්‍රස්ත ක්‍රියාවලියකි. "යකඩයෙන් තැලීම" නම් මෙම ක්‍රියාන්විතය විශේෂයෙන් ම ඉලක්ක කර ඇත්තේ ඊනියා "සුන්නි ත්‍රිකෝනය" ය යි. එය සුන්නි මුස්ලිම්වරුන් බහුල බැග්ඩෑඩ්හි සිට උතුරේ ටික්රිට් හා වටේට ඇති ෆලුජා, සමාරා, බකෝබා, තුලුයා හා බලාඩ් යන නගර වෙත දිවයන ප්‍රදේශය යි.

මෙය පරිමාවෙන් දැවැන්ත වූ ක්‍රියාන්විතයකි. නොවැම්බර් මස මැදභාගයේ එක් අවස්ථාවක බටයන් 25,000කට අධික එක්සත් ජනපද සේනාංක පහක් ඊට සම්බන්ධ විය.

ක්‍රියාන්විතයේ ප්‍රථම ඉලක්කයන් අතර, එක්සත් ජනපද ගනන් බැලීම් අනුව ක්‍රියාත්මක විරෝධතා මධ්‍යස්ථාන ලෙස සැලකූ බැග්ඩෑඩ් ජනාවාස තුනක් විය. ඉහල අහසේ හෙලිකොප්ටර් මගින් පලායන්නවුන් වලක්වාලු අතර, ප්‍රථම වතාවට එක්සත් ජනපද යුද ටැංකි හා සන්නද්ධ රථ මගින් සමස්ත ජනාවාසයම වටලන ලදි. ඉරාක පොලීසිය සමග එක්ව එක්සත් ජනපද හමුදා බියෙන් ඇලලීගත් ඉරාක වැසියන්ගේ නිවාස පරීක්ෂා කලහ. ආක්‍රමනිකයාගේ විරුද්ධවාදීන් යයි සැකකල 500කට අධික පිරිමින් සංඛ්‍යාවක් නිවෙස්වලින් ඇදගෙන එනු ලැබින.

ඉරාක අගනුවර තදාසන්නයේ ගරිල්ලන් සැඟව සිටිතැයි සැකකල නිවාස හා පාලුවට ගිය කම්හල් ඇතුලු ස්ථානයන්ට ඇපාචි ප්‍රහාරක හෙලිකොප්ටර්වලින් වෙඩි තැබී ය. නැතහොත් එෆ් 16 යුද්ධ ගුවන් යානාවලින් බෝම්බ දැමී ය. *වොෂින්ටන් පෝස්ට්* වාර්තාකරු නොවැම්බර් 21 දා පැවසුවේ "මේ සතියේ බැග්ඩෑඩය පුරා රෑපිලිරෑ දුන් ඇඟ කිලිපොලන පිපිරුම් හඬ හා කාලතුවක්කු වෙඩි හඬවල ඝෝෂාකාරය, සදාම් හුසේන්ගේ ආන්ඩුව බිඳවැටීමට පෙරාතුව ගෙනගිය, ඇඩි යුද ව්‍යාපාරය පිලිබඳ මතකයන් අවදිකරවී ය" යනුවෙනි.

ඉරාක ජනතාවගේ "සිත් හා හදවත්" දිනා ගැනීමේ වෑයමට මෙවන් ක්‍රියාවන්හි බලපෑම පිලිබඳව මිලිටරිය සැලකිලිමත් වූයේ දැයි නැඟුනු ප්‍රශ්නයකට පිලිතුරු දෙමින් ජෙනරාල් ඩෙම්ප්සේ මාධ්‍යයට පැවසුවේ "හෝව්, ඔබ දන්නවා මම නගරාධිපතිකමට ඡන්දය නො ඉල්ලන බව, ඉතින් ඇපාචි හෙලිකොප්ටරයක් ඉහල නංවන හැම විටෙක ම ඊට බැග්ඩෑඩ් ජනයාගේ සහයෝගය තිබේ යයි ඔබට ඒත්තු ගැන්වීමට මම උත්සාහ නො කරන්නෙමි" යනුවෙනි.

එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයේ කොටස් වසර මැද සිට දිගටම කියා සිටියේ ඉරාකීයන් රංචු පිටින් කොටු කරන ලෙස යි. *වෝල් ස්ට්‍රීට් ජර්නලය* ජූලි මාසය තරම් ඈතක දී "සුන්නි ත්‍රිකෝනයේ මහා පරිමාන කොටු කිරීමේ ප්‍රතිපත්තියක් වෙනුවෙන් කතුවැකි ලිවී ය. දැන් එය එහි පැතුම ඉටු කර ගෙන තිබේ. එක්සත් ජනපද ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ්ට අනුව ඒකාබද්ධ හමුදාවන් වැටලීම් 12,000ක් ද සෝදිසි මෙහෙයුම් 230ක් ද පවත්වා "සැකකරුවන්" 1200ක් දෙනා නොවැම්බර් 16 හා 23 අතර සතිය තුල පමනක් අල්ලාගෙන ඇත.

අල්ලාගත් ප්‍රදේශවල ඊස්රායල් මිලිටරිය විසින් පලස්තීනුවන්ට එරෙහිව ගෙන යනු ලබන සාපරාධී පලිගැනීමේ ක්‍රියාවන් අනුයමින් ඉරාකය "නිදහස් කිරීමට" යවනු ලැබූ එක්සත් ජනපද හමුදාවන්, දැන් විරෝධතා සටන්කරුවන් යයි සලකනු ලබන්නන්ගේ නිවාස විනාශ කරනු ලබන බව පිලිගනියි. ජිනීවා ප්‍රඥප්තියේ 33 හා 53 පරිච්ඡේදයන්ට අනුව සිවිල් වැසියන්ගේ නිවෙස් විනාශ කිරීම යුද අපරාධයකි.

අගනුවරට දකුනින් පිහිටි මාමුදියා නගරයේ විරෝධතා සටන්කරුවන් සය දෙනෙකුගේ නිවස 82 වන ගුවන් බලකාය විසින් විනාශ කලේ ය. නොවැම්බර් 18 වැනි දින ජෙනරාල් ස්වාන්නැක් මාධ්‍යයට ප්‍රකාශ කලේ "අප ඔවුන් අල්ලා සිර කලෙමු. සියලු නිවැසියන් ඉවත් කර අප ඔවුන්ගේ නිවස විනාශ කලෙමු." යනුවෙනි.

ජාත්‍යන්තර ක්ෂමා ආයතනය චෝදනා කලේ පවුලේ අයට ගොවිපලෙන් ඉවත්වීමට ලැබුනේ විනාඩි 30ක කාලයක් පමනක් බව යි. ඉන් පසුව එෆ් 16 ප්‍රහාරක ගුවන් යානා බෝම්බ දමා එය විනාශ කරනු ලැබුනි. "නජීම් පවුලේ නිවස විනාශ කිරීම, 'නිරපේක්ෂ මිලිටරි අවශ්‍යතාවක්' ලෙස නො ව, සාමූහික දඬුවමක් ලෙස ක්‍රියාවට නැංවූ බව පෙනී යයි."

නොවැම්බර් මස 16 හා 18 යන දින අතරතුර දී ටික්රිට් ප්‍රදේශයේ නිවාස 15ක් විනාශ කිරීම පිලිබඳව ක්ෂමා ආයතනය 4 වන පාබල සේනාංකයට ද චෝදනා කරයි. අල් හැවීඩා ගමෙහි නිවසක් විනාශ කිරීමට හෙලිකොප්ටර් හා යුද ටැංකි යොදාගත් අතර නිවැසියන්ට පිටව යාමට ලබාදුන්නේ විනාඩි පහක කාලයක් බව ද ඔවුහු කියා සිටිති.

මිලිටරි ක්‍රියාවලිය හමුවේ පවා ප්‍රතිරෝධය නො නැසී පවතිනවා පමනක් නො ව පැතිරී යන බවට ද ඇඟවීම් තිබේ. නොවැම්බර් අවසානයේ සංඛ්‍යාවන්ට අනුව මැයි මස පටන් සුන්නි ත්‍රිකෝනය තුල ගරිල්ලා ප්‍රහාර 2227ක් ද, රටේ අනෙකුත් ප්‍රදේශවල ප්‍රහාර 1416ක් ද සිදුව තිබේ. වාර්තාවලට අනුව අගෝස්තුවෙන් පසුව දකුනු දිග ඉරාකයේ ෂියයිට් ප්‍රදේශවල ප්‍රහාරයන් සංඛ්‍යාව දෙගුන වී තිබේ. උතුරු දිග මෝසුල් හා කිර්කුක් නගරවල ද ආක්‍රමන විරෝධී ක්‍රියාවන් උත්සන්න වී ඇත. සිය නම හෙලි නො කරන ලෙස ඉල්ලා සිටි ඇමරිකානු බුද්ධි අංශ නිලධරයෙකු *බොස්ටන් ග්ලෝබ්* පුවත් පතට ප්‍රකාශ කලේ "මා කනස්සල්ලට පත්ව සිටිනුයේ ගරිල්ලා ක්‍රියාවන්ට ලැබෙන පලල් සහයෝගය පිලිබඳව යි" යනුවෙනි.

## වැඩී යන සතුරුකම්

ඇමරිකානු මිලිටරිය "අනපේක්ෂිත හානි" ලෙසින් හඳුන්වනු ලබන, පවුල් සාමාජිකයන් මියයාම, ආබාධිත වීමට හෝ දේපල විනාශවීමට හෝ රටපුරා ඉරාකීයන් දස දහස් ගනනක් ගොදුරුව සිටිති. ඇමරිකානු හමුදා විසින් සැප්තැම්බර් 30 දින දක්වා වෙඩි තබා ඝාතනය කලවුන් සංඛ්‍යාව අවම වසයෙන් 94ක් බවට "හියුමන් රයිට්ස් වොච්" සංවිධානය සටහන් කලේ ය. මේ අතුරින් බොහෝ දෙනෙකු ඝාතනය කර ඇත්තේ ඇමරිකානු මිලිටරියේ මාර්ග බාධක වෙත ලඟා වෙද්දී සිය මෝටර් රථ තුලම ය. අනෙකුත් ඝාතන සිදුව තිබෙන්නේ සෙනග පිරි වීදිවල දී ඇමරිකානු හමුදා, තුවක්කුකරුවෙකු යයි අනුමාන කල අයෙකු දෙසට ඉවක් බවක් නැතිව වෙඩි වරුසා එල්ල කිරීමෙනි.

එම සංවිධානය මෙසේ පවසයි: "ප්‍රශ්නයට බඳුන්වන බොහෝ සිදුවීම් පිලිබඳව නියමිත වේලාවට හා පුලුල් ලෙස පරීක්ෂන නො පැවැත්වීම, බොහෝ සොල්දාදුවන්ට පරීක්ෂනයකට හසු නො වී තමන්ට කොකා ගැස්සිය හැකි යයි හැඟී යන, දඬුවමින් බේරී සිටීමේ වාතාවරනයක් නිර්මානය කර දී තිබේ."

පසුගිය සතියේ *ගාඩියන්* පත්‍රයෙහි පල වූ සංඛ්‍යාලේඛන මෙම චෝදනා සනාථ කරයි. තම පවුලේ සාමාජිකයන් නිකරුනේ මරා දැමීම, තුවාල සිදු කිරීම හෝ සිය දේපලවලට හානි කිරීම සම්බන්ධයෙන් පැමිනිලි 10,412ක් ඉරාක වැසියන් විසින් ඇමරිකානු ආක්‍රමනික අධිකාරියට එරෙහිව ගොනු කර තිබේ. කිසිදු එක්සත් ජනපද සොල්දාදුවෙකුට එරෙහිව සාපරාධී

චෝදනා ගොනු කල නො හැකි වී ඇත්තේ බුෂ් පරිපාලනය විසින් ස්ථාපනය කර තිබෙන ඉරාක පාලන කවුන්සිලය ඇමරිකානු මිලිටරිය ඊට එරෙහිව නඩු පැවරීමෙන් මුලුමනින් ම නිදහස් කර ඇති බැවිනි.

විපතට පත් ඉරාකීයන්ට ඩොලර් මිලියන 1.54ක් මුදලින් ගෙවා තිබෙන බව එක්සත් ජනපද මිලිටරිය පිලිගනියි. කෙසේ වුව ද වන්දි ගෙවීමෙන් සිදුව ඇත්තේ ඇමරිකානුවන් ඔවුන් සිදු කල වදවේදනාවන් පිලිබඳව නො තකන බව හා කනගාටුවට පත් නො වන බව පිලිබඳ අවබෝධය ඇවිල යෑම ය. *ගාඩියන්* පුවත් පත වාර්තා කල එක් සිද්ධියක දී, ඇමරිකානු හමුදා වෙඩි ප්‍රහාරයකින් සිය රථයේ ගමන් ගත් සැමියා ද, පුතා හා දූවරුන් දෙදෙනා ද එක් කාන්තාවකට අහිමි කලේ ය. මෙම පවුල සිය රථය පදවාගෙන ගියේ තමන් ජීවත් වන වීදිය ඔස්සේ ය. එහි කිසිදු මාර්ග බාධකයක් හෝ විරෝධතා ක්‍රියාවක් සිදුව නො තිබුනි. සතරදෙනාගේ අවමගුල සඳහා යන්තම් සෑහෙන 11,000ක සොච්චම් වන්දියක් ගෙවනු ලැබුනි.

මිලිටරි මර්දනය හා එක්සත් ජනපද හමුදා කෙරෙහි වැඩෙන සතුරුකම් අතර සම්බන්ධතාවය පසුගිය සතිවල දී මොසූල්හි දී විශේෂයෙන් ම දැකිය හැකි විය. නොවැම්බර් 16 දා ඇමරිකානු භටයන් 17කට මරු කැඳ වූ බ්ලැක් හෝක් හෙලිකොප්ටර් දෙකක් කඩාවැටීමේ සිද්ධියෙන් පසුව 101 වැනි ගුවන් සේනාංකය පල්ලි 10කට ද හානි සිදුකල මෙහෙයුමක් දියත් කලේ ය. එක්සත් ජනපද හමුදා, එක් පූජකයෙකු ද ඇතුලු මිනිසුන් 100ක් දෙනා පැහැරගෙන ගියේ නගරයේ වර්ධනය වන විරෝධතාවය පිටුපස සුන්නි පූජකවරු සිටින බවට චෝදනා කරමිනි. ප්‍රාදේශීය ජ්‍යෙෂ්ඨ පූජකවරයෙකු වන ෂීක් සාලි කලීල් හමුදි තැතිගත් ස්වභාවයෙන් *ගාඩියන්* පුවත්පතට ප්‍රකාශ කලේ එක්සත් ජනපද හමුදාවන්ගේ හැසිරීම ජනතාව කුපිත කර ඇති බව යි. "මෙමගින් තරුනයන් සදාම් හිතවාදීන් හා ආගමික අන්තවාදීන් වෙතට යොමු කරනු ඇතැයි" ඔහු අනතුරු ඇඟවී ය. දින ගනනාවකට පසුව නගරාසන්න කම්කරු පන්තික නිවහන් ප්‍රදේශයක දී පැරෂුට් භටයන් දෙදෙනෙකු මරා දැමුනු අතර ඉරාක තරුනයන් ඔවුන්ගේ සිරුරු කපා දමා තිබූ බවට චෝදනා නැගුනි.

මල සිරුරු කපා දැමුවේ ය යන කරුන ගැන ඇමරිකානු හා ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේ සැලකිය යුතු ප්‍රචාරයක් ලබාදුන්නේ ඉරාක විරෝධතාවය අමානුෂික ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාවක් ලෙසත් එබැවින් ඔවුන්ට ලැබෙන ඕනෑම දඬුවමකට ඔවුන් සුදුස්සන් බව පෙන්වා දීමටත් ය. කෙසේ වුව ද දිනපතාම ඉරාකීයන්ට එරෙහිව ගෙන යන මර්දනය, බියගැන්වීම් හා නින්දාවන් පිලිබඳව කුමන්ත්‍රනකාරී නිහැඬියාවක් පවත්වා ගනු ලබ යි. ඉදහිට දකින අහම්බයක දී හැරෙන්නට ඇමරිකානු රූපවාහිනිය හා මුද්‍රිත මාධ්‍ය "යකඩෙන් තැලීම" මෙහෙයුමෙන් ඉරාක ජනතාව මත ඇති කරන බලපෑම පිලිබඳව කිසිවක්ම අනාවරනය නො කරති.